**සීතාවක ප්‍රාදේශීය සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (i) පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබූ වට්ටම් රු.258,111ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේ සිට වට්ටම එලෙස ගිණුම්ගත නොකිරීමට කටයුතු කරමි. |
| (ii) පරිත්‍යාග වශයෙන් ලද රු.476,055 ක් වටිනා පුස්තකාල පොත් ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේ සිට පරිත්‍යාග එලෙස ගිණුම්ගත නොකිරීමට කටයුතු කරමි. |
| (iii) පැරණි ඉඩම්වල සභාව විසින් ඉදිකළ ගොඩනැගිලිවල වටිනාකම් ගිණුම්වල දක්වා නොතිබුණි. | අදාල ලේඛන යාවත්කාලීන කර ඉදිකිරීම් වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | සභාව සතු ඉඩම්වල සභාව විසින් ඉදිකළ ගොඩනැගිලිවල ඉදිකිරීම් වටිනාකම් වත්කම් ලේඛනවල ගිණුම්ගත කිරීම මේ වනවිට ආරම්භ කර ඇත. |
| (vi) 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබිය යුතු පොලිය ලෙස රු.2,699,864 ක් දක්වා තිබුණද එම ශේෂය තුල ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් ලද පොලියද ඇතුලත්ව තිබුණි. | නිවැරදිකළ යුතුවේ. | වැඩිපුර උපචිත කර ඇති රු. 2,699,864 ක මුදල ජ'නල් සටහන මඟින් 2019 වර්ෂයේ අවසාන ගිණුමට ගලපන බව දන්වමි. |
| (v) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම රු.4,991,346 ක් වූ ස්ථාවර වත්කම් 05 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට පියවරගත යුතුවේ. | 2019 ජ'නල් සටහන් අංක 04 මඟින් ස්ථාවර වත්කම් ගිණුමට ඇතුලත් කරමි. |

ආ. අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ කළුඅග්ගල ග්‍රාමයේ ස්ථාපිත "ලෙෂර් වර්ල්ඩ් වෝටර් පාක් පුද්ගලික සමාගම" විසින් සභාවට විනෝද බදු නොගෙවීම මත සභාව විසින් අවිස්සාවෙල්ල දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබූ අතර, එම විනෝද උයන අයිතිකරු විසින්ද සභාවට එරෙහිව නඩුවක් ගොනුකර තිබුණි. 2019 අප්‍රේල් 01 දක්වාම එම නඩු සමථයකට පත්වී නොතිබූ අතර, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි සටහනක් ලෙස හෙළිදරව්කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුමේ සටහනක් මඟින් හෙළිදරව් කිරීම හෝ නඩුවේ තීන්දුව ලබාදී ඇත්නම් ඒ අනුව කටයුතු කිරීමට සටහන්කර ගතිමි. |

1.4 අනුකූල නොවීම.

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු ධාවන තත්ත්වයේ පැවති වාහන 15ක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මාස 06 කට වරක් වන ලෙස ඉන්ධන පරීක්ෂා කටයුතු ඉදිරියේ දී නිවැරදි ලෙස සිදුකරමි. |
| (ආ) 2016 ජුලි 11 දිනැති අංක LGD/08/2016 දරන බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | සභාවට අයිති ඉඩම් හා දේපළ භෞතිකව හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඒ සඳහා කමිටුවක් පත් කරගෙන ඇති අතර එම කමිටු මඟින් ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනවල ලේඛනගත කිරීමටත්, ගිණුම්වල දැක්වීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) 2015 අගෝස්තු 24 දිනැති අංක 09/2015 දරන බස්නාහිර පළාත් මූල්‍ය චක්‍රලේඛය | අපහරණය කළයුතු වාහන 03ක් සම්බන්ධයෙන් එසේකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අලුත්වැඩියා කලයුතු වාහන අලුත්වැඩියා කිරීමටත් අපහරණය කලයුතු වාහන අපහරණය කිරීමටත් අදාළ අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 1993 නොවැම්බර් 18 දින නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ සැලසුම් චක්‍රලේඛ අංක 15 | පළාත් පාලන ආයතන මගින් අයකරනු ලබන සේවා ගාස්තු නාගරික සංවර්ධනය වෙනුවෙන් බැංකු ගිණුමක තැන්පත් කර හඳුනාගත් ව්‍යාපෘතින් සඳහා යොදාගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හංවැල්ල නගරයේ පොදු වැසිකිළි පද්ධතියක් සකස් කිරීම සඳහා රුපියල් මිලියන 10ක ඇස්තමේන්තුවක් සකස් කර ඇත. දැනට ගිණුමේ ඇති මුදල් ප්‍රමාණවත් නොවන නිසා ඉතිරි ප්‍රතිපාදන සලසා ගැනීමෙන් පසු මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමි. |

2. මූල්‍ය සමාලෝචනය
-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.25,357,963 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.45,556,388 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
--------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------------------------------------

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැ.31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ.31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. වරිපනම් හා බදු | 32,149,000 | 26,875,172 | 25,993,951 | 7,490,219 | 24,252,000 | 25,781,592 | 26,989,385 | 6,227,647 |
| ii. කුලී | 23,445,000 | 24,799,612 | 24,234,929 | 885,648 | 19,289,000 | 19,298,329 | 19,909,434 | 196,929 |
| iii. බලපත්‍ර ගාස්තු | 2,016,000 | 2,122,004 | 2,122,004 | - | 2,002,000 | 2,148,631 | 1,700,450 | - |
| iv. වෙනත් ආදායම් | 212,562,000 | 198,691,312 | 212,898,244 | 130,504,124 | 191,713,000 | 159,244,910 | 158,491,619 | 120,510,509 |
| එකතුව | 270,172,000 | 252,488,100 | 265,249,128 | 138,879,991 | 237,256,000 | 206,473,462 | 207,090,888 | 126,935,085 |

2.2.2 වරිපනම් හා බදු
---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) වරිපනම්<br>----------<br>සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.7,291,836 ක් වූ අතර ඉන් රු.5,407,530ක් පෙර වර්ෂවලට අදාල හිඟ වරිපනම් විය. සියයට 74 ක් වූ මෙම හිඟ වරිපනම් ශේෂය අයකර ගැනීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | වරිපනම් බදු හිඟ අයකර ගැනීම සඳහා උප කාර්යාල වෙත ඉලක්ක ලබා දී එහි ප්‍රගතිය ආදායම් එකතු කිරීමේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කරනු ලබයි. 2019.04.30 දිනට වරිපනම් බදු 2018.12.31 දිනට හිඟ මුදලින් රු. 266,181ක් අයකර ඇති අතර දේපල තහනම් කිරීමේ නිලධාරීන් වෙත හිඟ ලැයිස්තු ලබා දීම, දේපල තහනම් කිරීමේ කටයුතු ද කරගෙන යනු ලබයි. |

(ආ) අක්කර බදු

| | | |
|---|---|---|
| පාදුක්ක උපකාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු රු.188,235 ක් වූ අතර ඉන් රු.176,125 ක් වසර 10 කට වඩා වැඩි කාලයකට අදාල විය. මෙම හිඟය අයකර ගැනීමට මෙතෙක් පියවර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | මෙම අක්කර බදු හිඟ මුදල අය කර ගැනීම සඳහා ක්‍රියා මාර්ග රසක් ගෙන ඇත. අයිතිකරුවන් නොමැති දේපල හඳුනාගෙන කපා හැරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමුකර ඇත. |

2.2.3 උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| අවුරුදු 1 ත් 5 ත් අතර කාලයක සිට හිඟව පැවත එන රු.52,044,000ක්වූ ලැබිය යුතු උසාවි දඩ ශේෂය අයකර ගැනීමට සභාව විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | 2014 වර්ෂයට අදාල මුදල් 2019.02.12 දින ලැබී ඇත. 2015 ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා කාලයට අදාල උපලේඛන බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස් වෙත යොමු කර ඇත. 2015 ජුලි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලයට අදාලව උපලේඛන මේ වන විට සකස් කරමින් පවති. 2016 ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා උපලේඛන පරීක්ෂා කිරීම සඳහා අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමුකර ඇත. 2017 සහ 2018 වසර සඳහා උපලේඛන ඉදිරියේදී සකස් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත්, පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරනය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 වාර්ෂික ඇස්තමේන්තුවෙන් ඉහල මාවල්ගම සිට කහහේන මාර්ගයේ දුම්රිය පැන්නුම අසල බෝක්කුව දක්වා වූ මාර්ගය ඉදිකිරීම සඳහා රු.353,922 ක් වෙන්කර තිබුණද 2019 අප්‍රේල් වනවිටත් එම මාර්ගය නිමකර නොතිබුණි. | ඉදිකිරීම් කර්මාන්ත සැලසුම්කල ආකාරයට අප්‍රමාදව නිමකළ යුතුවේ. | අදාල කර්මාන්තයේ කොටසක් ඉදිකර ඇත. |

(ආ) වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත වටිනාකම රු.2,732,430 ක් වූ ව්‍යාපෘති 09ක වැඩ ආරම්භ කර නොතිබුණි. | ඉදිකිරීම් කර්මාන්ත සැලසුම්කළ ආකාරයට අප්‍රමාදව සිදුකළ යුතුවේ. | ව්‍යාපෘතියක් අවලංගු කර ඇති අතර ඉතිරි ව්‍යාපෘති 07හි වැඩ ඉදිරියේදී නිම කිරීමට නියමිතයි. |

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| | | |
|---|---|---|
| 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත රු.27,863,489 ක් වූ කර්තව්‍යයන් 19 ක් අත්හැර දමා තිබුණි. | සැලසුම් සකස් කිරීමේදී ඉටුකල යුතු කර්මාන්ත නිවැරදිව හඳුනාගත යුතුවේ. | අදාල කර්මාන්ත අවලංගු වී ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රයට අනුව සැලසුම් සකස් කර, සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රගති වාර්තා සකස් කර තිබුණද උපයෝගී සේවා, වන සම්පත රැකගැනීම, විදුලි බලය ආරක්ෂා කර ගැනීම සම්බන්ධ අයිතමයන්ගේ ඉලක්ක හා ප්‍රගතිය වාර්තාකර නොතිබුණි. | ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ඉටු කිරිමට නියමිතය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) පරිසර බලපත්‍ර<br>බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර හිමියන් 09 දෙනෙකු විසින් පරිසර බලපත්‍ර ලබා ගැනීම සඳහා රු.38,543 ක පරීක්ෂණ ගාස්තු ගෙවා තිබුණද සභාව විසින් ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදුකර පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි. | අප්‍රමාදව පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කළයුතුවේ. | 02කට පැමිණිලි ලැබී ඇති අතර 02ක් ඉදිරි පරිසර කමිටුවට යොමුකර ඇත. අනෙකුත් ඒවා පරිසර කමිටුවෙන් අනුමත වී ඇත. |

(ආ) ප්‍රජා මණ්ඩල පිහිටුවීම

-------------------------

| | | |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ ග්‍රාම සේවා වසම්වල ප්‍රජා මණ්ඩල පිහිටුවීමට ඒ ඒ සභා ප්‍රදේශවල නියෝජිතයින්ට උපදෙස් දී ඇතත්, 2018 වර්ෂය තුල ප්‍රජා මණ්ඩල පිහිටුවා නොතිබුණි. | ප්‍රජා මණ්ඩල පිහිටුවීමට කටයුතු කළයුතුවේ. | 2018 වර්ෂයේ පත්වූ නව මන්ත්‍රී මණ්ඩලය සඳහා ප්‍රජා මණ්ඩල ව්‍යවස්ථා ලබා දෙමින් ඔවුන් මේ සඳහා දිරිමත් කිරීමට කටයුතු සිදුකල අතර 2019 වර්ෂයේ 2019.02.16 වන දින ප්‍රථම ප්‍රජා මණ්ඩල පිහිටුවීමට කටයුතු සංවිධානය කර ඇත. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

--------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම.** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 222 ක් වූ අතර ප්‍රාථමික හා ද්විතියික ශ්‍රේණිවල පුරප්පාඩු 29 ක් පැවතුණි. තත්‍ය කාර්ය මණ්ඩලය 308 ක් වූ අතර ඉන් 115 ක්ම ආදේශක සේවකයින් විය. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමටත් අතිරික්ත සේවකයින් විධිමත් කරවා ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | ද්විතීක ගණයේ නිලධාරීන් - 06<br>පුස්තකාලයාධිපති තනතුරු 03 ක් හා සංවර්ධන නිලධාරි 01 පුරප්පාඩු ව පවතී. එම තනතුරු පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. ආදායම් පරීක්ෂකවරුන් බඳවා ගැනීම පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවතින බැවින් එහි විසඳුම ලැබෙන තෙක් ඒ පිළිබඳ කටයුතු කළ නොහැක. පුරප්පාඩුව පවතින සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් සිටී.<br>ප්‍රාථමික ගණයේ සේවකයින් - 23<br>රියදුරු 05, වැඩ කෙෂ්ත්‍ර කම්කරු 11, සෞඛ්‍ය කම්කරු 04, පුස්තකාල සහායක, බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු , සුසානභූමි භාරකරු ලෙස පුරප්පාඩු 23 ක් පවතී. එම සේවකයින් ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරමි.<br>තාවකාලික කොන්ත්‍රාත් සේවකයින් - 115<br>ස්ථිර සේවකයින් නිවාඩු ලබා ගන්නා අවස්ථාවලදී රාජකාරි ආවරණය කිරිම සඳහා මෙම ආදේශක සේවකයින් යොදවා ගනු ලැබේ. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

කඩ කුලිය තක්සේරු කිරීම.

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 නොවැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සභාවේ කඩ කාමර තක්සේරුකර තිබූ අතර නව තක්සේරු මුදල කඩහිමියන් ප්‍රතික්ෂේප කිරීම නිසා | සංශෝධිත තක්සේරු වටිනාකමට කඩ කුලී අයකර | 2018.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හංවැල්ල නව වෙළඳ සංකීර්ණයේ කඩවල මාසික කුලිය සංශෝධනය කර ඒ පිළිබඳව කඩහිමියන් වෙත දැනුම් දී ඇත. නමුත් එම සංශෝධිත කුලිය ගෙවීමට නොහැකි බව දන්වා කඩහිමියන් |

| | | |
|---|---|---|
| රු.282,075 ක් සභාවට අහිමි වී තිබුණි. | ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර මේ වනවිට සංශෝධිත තක්සේරුව ලැබී ඇත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් ලබා දී තිබූ වටිනාකම සඳහන්ව නොමැති ට්‍රැක්ටරයක් සහ ටේලරයක් 2014 වර්ෂයේ සිට හංවැල්ල පෞද්ගලික ගරාජයකටදී අළුත්වැඩියාවකින් තොරව ගලවා දමා ඇති අතර 2019 අගෝස්තු දිනවන විටත් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගතයුතුවේ. | 2018.09.10 වන දින කඩුවෙල මහා නගර සභාව වෙත අළුත්වැඩියාව සඳහා යොමු කළ ට්‍රැක්ටරය අළුත්වැඩියා කටයුතු අවසන් කර අප සභාව වෙත භාරදුන් පසු අනෙක් ට්‍රැක්ටරය අළුත්වැඩියාව සඳහා කඩුවෙල මහා නගර සභාව වෙත යොමු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) අළුත්වැඩියා කටයුතු සඳහා කඩුවෙල මහා නගර සභාවට භාර දී ඇති අංක 49 -0266 දරන ට්‍රැක්ටර් රථය මෙතෙක් සීතාවක ප්‍රාදේශීය සභාවට රැගෙන ඒමට කටයුතු කර නොතිබුණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගතයුතුවේ. | 49 – 0266 දරණ ට්‍රැක්ටරය 2018.08.27 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ දී ගත් තීරණයක් අනුව 2018.09.10 වන දින අළුත්වැඩියාව සඳහා කඩුවෙල මහා නගර සභාව වෙත යොමු කර ඇති අතර ඉදිරි දින 14 ක් තුලදී අදාළ අළුත්වැඩියා කටයුතු අවසන් කළ හැකි බවත් අප වෙත දන්වා ඇත. |
| (ඇ) 2018 වර්ෂයේදී සභා ශාලාවට අළුතින් ශබ්දවාහිනී යන්ත්‍ර සවිකිරීමෙන් පසු සභා ශාලාවේ ක්‍රියාත්මක තත්ත්වයේ තිබූ මයික්‍රෆෝන 22 ක් ගලවා ඉවත්කර ඇති අතර ඒවා නිශ්කාර්යව ගබඩාවේ තබා තිබුණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගතයුතුවේ. | ගබඩාව සතුව ඇති මයික් 22 ක් උපදේශක කාරක සභා පැවැත්වීම සඳහා භාවිත කිරීමට මේ වන විට ඇණවුම් කර ඇති මේසය ලද විට ඒ සඳහා භාවිත කිරීමට රඳවාගෙන ඇත. |
| (ඈ) 2005 වර්ෂයට පෙර භාවිතයේ තිබූ පැරණි ගොඩනැගිල්ල දිගු කාලයක සිට අභාවිතව පැවතුණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම හෝ සුදුස්සක් කළ යුතුවේ. | දැනට හංවැල්ල නගරයට තිබෙන සභාව සතුව පවතින එකම උත්සව ශාලාව සඳහා වැසිකිළි පද්ධතියක් නොමැති බැවින් මෙම ගොඩනැගිල්ලේ ඉහල මාලයේ කොටසක් කාන්තා හා පිරිමි වැසිකිළි පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහාත්, පහත මාලය ගබඩාවක් ලෙස පවත්වාගෙන යාමටත් සැලසුම් සකස් කර ඇත. |

3.5.2 වාහන පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සභාව සතු කැබ්රථය බොරළුගොඩ ප්‍රදේශයේදී ත්‍රීරෝද රථයක ගැටී සිදු වූ අනතුර සම්බන්ධව වාහන ලිපිගොනුවේ හෝ වාහන ලොග් පොතෙහි හෝ හානිපාඩු ලේඛණයෙහි සටහන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී සිදුවන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.104 හා 109 මගින් දන්වා ඇති උපදෙස් පරිදි ක්‍රියාකරන බව ද දන්වා සිටිමි. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම.** |
|---|---|---|
| ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | කාර්යක්ෂම අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුවේ. | එම අභ්‍යන්තර විගණන විමසුම් පිළිබඳ අධීක්ෂණ කටයුතු කරගෙන යන අතර එම වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව කටයුතු කරන ලදී. |